
# කියන දේ නාහන නංගි



ඔනෙලි වික්‍රමසිංහ

කෘතියේ නම - කියන දේ නාහන නංගි

කතෘගේ නම - ඔනෙලි වික්‍රමසිංහ

මෙම කෘතියේ පූර්ණ අයිතිය කතෘ වන ඔනෙලි වික්‍රමසිංහ සතුවේ.

කෘතිය පල කරන දිනය - 2023.11.15

# පිදුම

කියන දේ නාහන මගේ නංගි
ඇතුළු මේ පොත
කියවන දඟකාර චූටි බබාලා
හොඳ ගති පැවතුම් ඇති,
හැමෝම ආදරය කරන
දරුවන් වේවා!
~

# ස්තූතිය.

*********

මෙම පොත ලිවීමට මා දිරිගැන්වූ සමන්මලී ගුරු මැණියන්ට ද මාගේ දෙමාපියන්ටද, නන් අයුරින් උපකාර කළ සැමටද, මාගේ හදපිරි ස්තූතිය පුද කර සිටිමි

***

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිද කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවන්ගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැන්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණ මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස්ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබුණු සුවිශේෂ ජයග්‍රහණය ක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසැල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය  මෙවර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "  වැඩසටහන හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසැල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023. සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසැල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් " වැඩසටහනට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රර්ථනා කරමු.

මෙම වැඩසටහන වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාපියන් ආදී ශිෂ්‍යාවන් සෙසු පාසැල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ගුරු විදුහල්පති

ශෂිකලා සේනාධීර

මහාමායා බාලිකා විද්‍යාලය -මහනුවර

2023.11.01

ඔන්න එකමත් එක කාලෙක යෙහාරයි සෙහාරයි කියලා නිවුන් සහෝදරියන් දෙන්නෙක් හිටියා.



ඉතිං අක්කගේ නම තමයි යෙහාරා. නංගි සෙහාරා. මේ දෙන්නම ඉස්කෝලේ යනවා. මේ දෙන්නා ඉගෙන ගන්නේ තුන වසරේ.

ඉතිං අම්මා මේ දෙන්නව උදෙන්ම ඇහැරවනවා. ඒත් මේ දෙන්නගෙන් නංගි හරිම කම්මැලියි. අක්කානම් හරිම කඩිසරයි.නංගි උදේට දත් මදින්නේත් බාගෙට,

ඇඟ සෝදන්නෙත් බාගෙට.

ඉක්මනින්ම ඉස්කෝලේ ඇඳුම දාගෙන අක්කාත් එක්ක ඉස්කෝලෙට යනවා.      ඉතිං බාගෙට මූණ සෝදන නිසා මෙයා ගේ ඇස්වල කබත් තියෙනවා



ඉතිං මේ සෙහාරා බාගෙට ඇඟ සෝදන නිසා එයා හරිම අපිරිසිදුයි. පන්තියේ ළමයිනුත් මෙයාට ගොඩක් ම අකමැතියි. ඒත් අක්කට නම් ළමයි හරිම ආසයි.

ඉතිං දවසක් මේ දෙන්නා ඉස්කෝලේ ඇරිලා එද්දී....



මේ දෙන්නා අඹ ගහක් යට අඹ ගෙඩියක් වැටිලා තියෙනවා දකිනවා. ඉතිං නංගි ගියපු ගමන් ම  ඒ අඹ ගෙඩිය අහුලන් කෑවා.

නරක් වෙලා ද පණුවෝ ඉන්නව ද කියලා බැලුවේ නෑ.නිකම්ම කෑවා. නංගි අක්කා එපා කියන දේ ඇහැව්වෙවත් නෑ.

නංගි ගෙදර යන ගමන් ඒ අඹ ගෙඩිය කකා ගියා.



ඔන්න ඉතිං නංගි ගෙදර ආව ගමන් ම  අම්මා ළගට ගිහින් කිව්වා, බඩ රිදෙනවා කියලා.

ඊට පස්සේ අම්මා නංගිව ඉක්මනට ඉස්පිරිතාලෙ ට එක්ක ගියා.



ඊට පස්සේ දොස්තර මාමා නංගිට මෙහෙම කිව්වා, "  ආයේ අම්මගෙන් අහන් නැතිව කිසිම දෙයක් කන්නවත් බොන්නවත් එපා"

ඊට පස්සේ නංගි ආය ඒ දේ කරන්නෙම නෑ කිව්වා.

අම්මා අක්කටයි නංගිටයි හැමදාම රෑට දත් මැදලා නිදාගන්න කියනවා. ඒත් අක්කා විතරයි රෑට දත් මැදලා නිදාගන්නේ.නංගි රෑට දත් මැද්දේ නෑ.



ඉතිං ටික කාලයක් ගත වුණා. නංගි ඉස්කෝලේ ඉද්දී එයාට දත් කැක්කුමයි කියලා ගුරුතුමියට කිව්වා.ගුරුතුමිය පැනඩෝල් පෙත්තක් බොන්න කියලා නංගිට දුන්නා. දෙන්නම හවස ඉස්කෝලේ ඇරිලා ගෙදර ආවා.හවස් වෙනකොට ආයෙත් දත් රිදෙන්න ගත්තා.ඊට පස්සේ අම්මා දත් දොස්තර මාමා කෙනෙක් ළඟට එක්කන් ගියා. "දත හොඳටම පණුවෝ කාලා. ඇයි රෑට දත් මදින්නේ නැද්ද", කියලා දොස්තර මාමා ඇහුවා. නංගි ලැජ්ජාවෙන් බිම බලාගත්තා.

අන්තිමට දත ගලවලා දාන්නයි වුණේ.

නංගි ගොඩක් ඇඬුවා.

ඉතිං ඊට පස්සේ අක්කයි නංගියි වෙනදා වගේම ඉස්කෝලෙ ගියා.

ළමයි ඔක්කොම නංගිට දත් නැති ආච්චි කියලා කිව්වා.නංගි හොඳටම ඇඬුවා. “මම කිව්ව දේ ඇහුවා නම් මෙහෙම වෙන්නේ නෑනේ” ,අක්කා කිව්වා. එදයින් පස්සේ නංගි හොඳ ළමයෙක් වුණා.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසැල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔහුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාව ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශය ට පෞද්ගලි යෝජනාවක් ලෙස පාසැල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසැල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසැල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළගාවීමට නූතන තාක්ෂනය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වු මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි.මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් හා පාසැල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පැමිණි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරියක් වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසැල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කල ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01